DOI : 10.31357/fhssmst.2006.00650

# ග්‍රාමීය කාන්තාවගේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා කාන්තා කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන චක්‍රීය ණය ව්‍යාපෘතිය පිළිබඳ *සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්*

**(මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)**

*ශාස්ත්‍රපති සමාජවිද්‍යා උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය*

ඩබ්. එම්. චන්ද්‍රානි මැණිකේ
පශ්චාත් උපාධි පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල-නුගේගොඩ

2006

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම නිබන්ධනයෙහි මීට පෙර කිසිම විශ්ව විද්‍යාලයක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයක අඩංගු කරුණු කිසිවක් ඒ බැව් නිසි ලෙස ප්‍රකාශ කිරීමකින් තොරව ඇතුලත් කර නැති බවත්, මාගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව වෙනත් කිසිවකු විසින් මීට පෙර ලියන ලද හෝ මුද්‍රිත කිසිම කරුණක් එකී කෘතිය පිළිබඳ නිමිත සඳහනකින් තොරව ඇතුලත් කර නොමැති බවත්, මම මෙයින් සහතික කරමි.

අත්සන ---------------

නමඃ-ඩබ්. එම්. චන්ද්‍රානී මැණිකේ

# උපදේශකගේ ප්‍රකාශය

සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සඳහා ඩබ්.එම්. චන්ද්‍රානි මැණිකේ විසින් ඉදිරිපත් කරන ලද මෙම නිබන්ධනය, මාගේ උපදෙස් හා මග පෙන්වීම් අනුව කරන ලද්දක් බවත්, ශාස්ත්‍රපති උපාධිය සඳහා සුදුසු බවත් ප්‍රකාශ කරමි.

7/1/12.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ආචාර්ය ජයන්ත ජයසිරි,
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යානංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

පිදුම

ආදරණීය

අම්මාට අප්පච්චිට

දයාබර ස්වාමියාට සහ

මාගේ පුතු සාරතට

සෙනෙහසින්

# ප්‍රණාමය

සමාජ විද්‍යා පශ්චාද් උපාධි අපේක්ෂිකාවක ලෙස ලැබූ න්‍යායාත්මක දැනුම පදනම් කොටගෙන ස්වාධීන අධ්‍යයනයක් කිරීම පිලිබඳ මූලික මග පෙන්වීම කල, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආචාර්ය ස්වර්ණා පෙරේරා මහත්මියටත්, මෙම පර්යේෂණය කිරීමට මුලපිරූ මොහොතේ සිට අවසානය දක්වා සාර්ථකත්වයට උපදෙස් සපයමින් නිසිමග පෙන්නවූ සමාජ හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ජයන්ත ජයසිරි මහාතාටත්,

මාගේ අධ්‍යයන කාලසීමාව තුල න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදෙමින් මා දිරිමත් කල මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහතාටත් මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුදකරමි.

නිබන්ධනය සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීමේ දී සහය ලබාදුන්

- ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂිකා නාමිනී ගුණසේකර මහත්මිය ඇතුළු සහකාර අධ්‍යක්ෂිකා ලිසි මහත්මිය හා පුස්තකාල කාර්ය මණ්ඩලයටත්,
- බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ද,

බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාන්තා සංවිධානවල සාමාජිකාවන්ටත්, මෙම නිබන්ධනය මනා ලෙස පරිඝණක ගතකර දුන් මාගේ දයාබර ස්වාමියාවන සුදත් ගමගේටත්, නන් අයුරින් මට සහය වූ සහෝදර මංගල චන්දන හා චන්දන සල්ගාදුටත් මගේ ගෞරව පූර්වක ප්‍රණාමය පුද කරමි.

## සිතියම් පටුන

01. මොණරාගල දිස්ත්‍රික් සිතියම

02. කොට්ඨාස සිතියම

03. ග්‍රාමනිළධාරී වසම් සිතියම

04. ජනගහන බෙදීයාම

05. භූවිෂමතා සිතියම

06. ජලවහන රටාව

07. පසෙහි ව්‍යාප්තිය

08. කෘෂි දේශගුණික කළාප

09. ගංභා හා වැව් අමුණු

**වගු අංක සටහන**

01. ශ්‍රමබලකායේ සහභාගිත්ව අනුපාතය 1.1

02. 1992 වර්ෂයේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව අධ්‍යාපන තත්ත්වය 2.1

03. සේවා වියුක්තිය ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව 2.2

04. ශ්‍රී ලාංකිකයන් විදේශ රැකියා සඳහා නික්මයාම 2.3

05. කන්තා කාර්ය සංවිධාන සහ ප්‍රාදේශීය බලමණ්ඩල ලියා පදිංචිය 3.1

06. 1990-1999 දක්වා නිකුත්කර ඇති චක්‍රීය ණය 3.2

07. 1991 වර්ෂයේ බුත්තල කොට්ඨාසයේ චක්‍රීය ණය තැන්පත් කිරීම 3.3

08. 1998 වර්ෂයේ බුත්තල කොට්ඨාසයේ චකීය ණය තැන්පත් කිරීම 3.4

09. 2001 වර්ෂයේ බුත්තල කොට්ඨාසයේ චක්‍රීය ණය තැන්පත් කිරීම 3.5

10. ආගම අනුව ජනගහනය 4.1

11. කොට්ඨාසයේ ජාතීන් අනුව ජනගහනය 4.2

12. බුත්තල කොට්ඨාසයේ වර්ෂාපතනය 4.3

13. බ්ත්තල කොට්ඨාසයේ උෂ්ණත්වය 4.4

14. රැකියා නියුක්තිය 4.6

15. බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසෙයේ සමෘද්ධි ලබාදීමේ වර්ගීකරණය 4.7

16. බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසෙයේ සහනාධාර ගෙවීම් 4.8

17. කර්මාන්ත පිළිබඳ තොරතුරු 4.9

18. සමාජිකාවන්ගේ වයස් මට්ටම් 5.1

19. දරුවන්ගේ වයස් ප්‍රමාණය 5.2

20. දරුවන්ගේ අධ්‍යාපන මට්ටම 5.3

21. ආදායම් මාර්ගවල ස්වභාවය 5.4

22. පවුල්වල ආදායම් මට්ටම 5.5

23. නිවාසවල අයිතිය 5.6

24. නිවාස වර්ග කිරීම 5.7

25. නිවාසවල තත්ත්වය 5.8

26. පවුල්වල විදුලිය විද්‍යුත් මාධ්‍ය භාවිතය 5.9

27. ප්‍රදේශයේ පවුල් පානීය ජලය ලබාගන්නා ආකාරය 5.10

28. වැසිකිළි භාවිතය 5.11

29. පවුල්වල ඉඩම් භුක්තිය 5.12

30. ඉඩම්වල නිත්‍යානුකුලභාවය 5.13

31. පවුල් සඳහා ඉඩම්වල අයිති ප්‍රමාණය 5.14

32. බුත්තල ප්‍රදේශයේ චක්‍රීය ණය ලබා ගැනීමේ ස්වරූපය 6.1

33. ස්වයං රැකියාවල යෙදෙන කාන්තාවන්ගේ මාසික ආදායම 6.2

34. කාන්තා කාර්ය සංවිධානවල සාමාජිකාවන් ලබා ඇති පුහුණුවීම් 6.3

35. චක්‍රීය ණය අයවීම 6.4

# පටුන

පිටු අංකය

*01 වන පරිච්ඡේදය.*

***01. පර්යේෂණ සැළැස්ම හා ක්‍රමවේදය පිළිබඳ හැඳින්වීම 01-17***

1.1 මාතෘකාව හැඳින්වීම. 01

1.2 පර්යේෂණයේ අරමුණ හා පරමාර්ථ. 08

1.3 පර්යේෂණ ගැටළුව. 09

1.4 න්‍යායාත්මක එළඹුම. 10

1.5 ක්‍රම වේදය. 13

1.6 පර්යේෂණ සීමා. 15

1.7 පරිච්ඡේදගත කිරීම. 16

*2 වන පරිච්ඡේදය*

***02. කාන්තාව හා කාන්තාවගේ සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ හැඳින්වීම18-49***

2.1 කාන්තාවන් පිළිබඳව හැඳින්වීම. 18

2.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය. 23

2.3 කාන්තා ප්‍රඥප්තිය. 26

2.4 ජාත්‍යන්තර කාන්තා දිනය. 30

2.5 දේශපාලන ක්ෂේත්‍ර තුල කාන්තා සහභාගිත්වය. 31

2.6 කාන්තාව සහ ආර්ථිකය. 34

2.7 කාන්තාවගේ අධ්‍යාපනය හා පුහුණුව. 39

2.8 ශ්‍රී ලාංකික කාන්තාවගේ සේවානියුක්ති ස්වභාවය. 42

*3 වන පරිච්ඡේදය*

***03. ශ්‍රී ලංකා කාන්කා කාර්යාංශය හා චක්‍රීය ණය අරමුදල. 49-68***

3.1 ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය ආරම්භය හා වර්ධනය. 49

3.2 කාන්තා කාර්ය සංවිධාන පිහිටුවීම. 53

3.3 ප්‍රාදේශීය කාන්තා කාර්ය සංවිධාන බල මණ්ඩලය. 56

3.4 කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල කිරීම සඳහා කාන්තා කාර්යාංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන්. 58

3.5 චක්‍රීය ණය අරමුදල. 59

3.6 චක්‍රීයණය වැඩසටහන ශ්‍රී ලංකාව තුල ක්‍රියත්මකවන ආකාරය.65

### *4 වන පරිච්ඡේදය*

*04. බුත්තල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය පිළිබඳ හැඳින්වීම 69-87*

4.1 බුත්තල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඓතිහාසික හා ජනගහන තොරතුරු 69

4.2 බුත්තල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම. 72

4.3 බුත්තල ප්‍රදේශීය ලේඃ කොට්ඨාසයේ නිවාස පිළිබඳ තොරතුරු 76

4.4 කොට්ඨාශයේ රැකියා නියුක්තිය හා ආදායම් මට්ටම. 78

4.5 කෘෂිකර්ම පශු සම්පත් හා විභවතා. 81

4.6 කර්මාන්ත අංශය. 82

4.7 බුත්තල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ සෞඛ්‍යය තත්ත්වය හා පාරසරික ගැටළු. 85

### *5 වන පරිච්ඡේදය*

*05. ක්ෂේත්‍ර සමීක්ෂණ තොරතුරු 88-102*

5.1 නියැදියේ පවුල්වල මූලික තොරතුරු 88

5.2 ප්‍රදේශයේ අධ්‍යාපන මට්ටම හා ආර්ථික තොරතුරු 90

5.3 කාන්තා කාර්ය සංවිධානවල සමාජිකාවන්ගේ නිවාස හා වෙනත් තොරතුරු 93

5.4 විදුලිය හා සංනිවේදන පහසුකම්. 95

5.5 සනීපාරක්ෂක පහසුකම් 97

5.6 පවුල්වල ඉඩම්භුක්තිය 99

*6 වන පරිච්ඡේදය*

*06 චක්‍රීය ණය අරමුදල හා කාන්තා කාර්ය සංවිධාන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සමීක්ෂණ තොරතුරු* *103-123*

6.1 චක්‍රීය ණය ලබාගත් කර්මාන්ත හා වෙළඳපළ 103

6.2 කාන්තාවන්ගේ ස්වයං රැකියාවලින් ලැබෙන ප්‍රතිලාභ 108

6.3 ස්වයං රැකියාවලින් ලැබෙන ආදායම අඩුවීමට බලපාන හේතු 109

6.4 චක්‍රීය ණය අයවීම 115

6.5 චක්‍රීය ණය අයවීම සහ කාන්තා කාර්ය සංවිධාන 120

*7 වන පරිච්ඡේදය*

නිගමන සහ යෝජනා **124-128**

ග්‍රන්ථ නාමාවලිය **129-135**

*08 ඇමුණුම*

01 කාන්තා කාර්ය සංවිධානවල අතුරු ව්‍යවස්ථාව

02 කාන්තා බල මණ්ඩල සංවිධානවල අතුරු ව්‍යවස්ථාව

03 චක්‍රීය ණය ඉල්ලුම්පත

04 ප්‍රශ්නාවලිය

## 1වන පරිච්ඡේදය

### *01. පර්යේෂණ සැලැස්ම හා ක්‍රමවේදය පිළිබඳ හැඳින්වීම*

### 1.1 මාතෘකාව හැඳින්වීම

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පිළිබඳ අවධානය යොමුකිරීමේදී වැදගත් සාධකයකි රාජ්‍ය හා රාජ්‍ය නොවන මට්ටමෙන් ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති. රටේ මුළු ජනගහනය වැඩි පිරිසක් ග්‍රාමීයව ජීවත්වන අතර ඉන් අඩක්ම කාන්තාවන්ය.

සාම්ප්‍රදායික දිවිපෙවතකට උරුමකම් කී ගැමි කාන්තාව එදා ජාතික ආදායමේ ප්‍රධාන දායකත්වයක් ලබාදුන් කෘෂි කර්මාන්තයේ ශ්‍රමිකයා විය. වර්තමානයේ ඇඟළුම් කර්මාන්තයේ හා විදේශ රැකියාවල නියුක්ත වෙමින් ජාතික ධනය උපයා දෙන්නේ ගම්බද කාන්තාවයි.

සංවර්ධන ක්‍රියාවලිය තුළ කාන්තාවගේ ශ්‍රම දායකත්වය වර්ධනය වූවද වර්තමාන කාන්තාවගේ සේවා තෘප්තිය හා ජීවන මට්ටම දෙස බැලීමේදී අපට පෙනී යන කරුණක් වන්නේ බොහෝ ගැටළු ඉස්මතු වී ඇති බවයි. පසුගිය වසරවල ආර්ථික වර්ධන සහ සංවර්ධන ක්‍රියාවලිය තුල කාන්තා සහභාගීත්වය වර්ධනය වීම නොකඩවා පැවතියේ වූවද ඔවුන්ගේ බලය පැවරීමට අදාළ සමහර කරුණු පැහැදිලිකමක් නැත. ඒ නිසාම වර්තමානයේ කාන්තාවෝ සංවිධාන ලෙස ඒකරාශි වී තම අයිතිවාසිකම් ලබාගැනීමේ ලා

උද්ඝෝෂණ වල යෙදෙන අයුරු බහුලව දක්නට ලැබේ. මේ ඉල්ලීම් අතර කාන්තාවට නීතිවල අවශ්‍යතා, ස්ත්‍රී පුරුෂ සමානතාවය, දේපල අයිතිය, සමාන වැටුප්, රැකියා නියුක්තිය, වදහිංසා වලට ලක්වීම වැනි කරුණු ප්‍රධාන වේ.

පොදුවේ කාන්තාවට මෙවැනි ගැටළු සහගත තත්ත්වයන් පැවතුනද ග්‍රාමීය කාන්තාව දෙස බැලූවිට මෙම තත්ත්වය ඊට වඩා සංකීර්ණය. ඇයට ඉහත කී කරුණුවලට අමතරව නූගත්කම, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, සුභ සාධන පහසුකම් සැපයීම වැනි දේ සඳහා සකසන ලද ප්‍රතිපත්ති ද ඉතා පහල මට්ටමක පවතී. සාම්ප්‍රදායික රටවල ඇති වූ යටත් විජිතවාදි ප්‍රතිඵලයන්ගෙන් ද ධනවාදය, නාගරිකරණය, කාර්මීකරණය වැනි සංකල්ප හමුවේද සීග්‍රයෙන් වර්ධනයවන්නා වූ නව තාක්ෂණික මෙවලම් හමුවේද 21වැනි ශත වර්ෂයේ මුහුණදුන් ගෝලීයකරණය වැනි සංකල්ප හමුවේද ගම්බද කාන්තාවෝ පෙලෙන අවාසි සහගත තත්ත්වය නිතරම පාහේ වැඩි කොට තිබේ.

**ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය/ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව**

(1.1වගුව)

| | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුරුෂ | 64.8 | 65.2 | 65.3 | 65.4 | 64.4 | 66.1 | 64.8 | 67.7 | 67.9 | 66.6 |
| ස්ත්‍රී | 35.6 | 31.0 | 33.1 | 32.0 | 31.7 | 30.7 | 32.3 | 35.5 | 33.0 | 32.9 |

මූලයඃ-ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව 46සංඛ්‍යා සටහනල මහ බැංකු වාර්තාව 2000

ඉහත වගුව අනුව අපට පෙනෙනුයේ 1991 සිට 2000 වර්ෂය දක්වා ශ්‍රම බලකායේ ස්ත්‍රී හා පුරුෂ ජනගහනය අනුව ඇති පරතරයයි. පුරුෂ සහභාගිත්ව අනුපාතය 64.4 සිට ඉහල අගයක් ගන්නා අතර ස්ත්‍රී සහභාගීත්ව අනුපාත අගය 1991 දී 35.6 වන අතර 2000 දී 32.9 දක්වා අඩු වී ඇත. මේ දෙපාර්ශවය අතර අනුපාතයන්ගේ ද විශාල පරතරයක් ඇත. නමුත් ගම්බද කාන්තාවගේ දෛනික කටයුතු සැළකිල්ලට ගැනීමේ දී ඔවුන්ගේ ශ්‍රමය පවුලේ ආර්ථිකයට කොපමණ දායක වී ඇතිද ගෘහ කළමණාකරණයේ දී ඇයගේ ශ්‍රමය ජාතික ශ්‍රමයට දායක නොවන්නේ ද ගැටළුවකි.

**Nickelly Dorsey** දක්වා ඇති පරිදි ගෘහ කළමණාකරණය යනු ජීවත් වන පවුල් ඒකකය පාලනය කිරීමයි. කෙටියෙන් කියනවානම් ගෘහ කළමණාකරණය යනු සැළසුම් කිරීම, පාලනය කිරීම හා පවුලේ සම්පත් පරිහරණය සඳහා ඇහයිමයි. එසේ කළමණාකරණය කරනුයේ පවුලේ අරමුණ කරා ලඟා වීමටයි.**(Quoted in Laxmi Devi,**1988, **p:11)** ඉහත නිර්වචනයට අනුව ගෘහ ඒකකය තුල ආර්ථික හා සමාජීය වශයෙන් පවුලේ කාර්යයන් ඉෂ්ඨ කිරීමේ දි කාන්තාව සතු කාර්යයභාරයන් බොහෝ ය. නමුත් ඒවා ඇහයීම් නොකිරීමට හේතුව සමාජ සංවිතය තුලින්ම මේ කාර්යය භාරයන් පැවරී ඇති නිසා විය හැකිය. ශ්‍රී ලංකාව වැනි යටත් විජිතවාදී රටවල කාන්තාවන් දෙස බැලීමේ දී අපට පෙනෙනුයේ ඉතිහාසයේ පටන්ම හානි පමුණුවන්නා වු එක එල්ලේම නොපෙනෙන නීතිරීති, සමාජ බැදීම්, සමාජ තහංචි වක්‍රාකාරව ගම්බද කාන්තාව දෙස තාමත් බලපාන බවයි.

ගත වූ කාලපරිච්ඡේදයේ දී කාන්තාවගේ ආර්ථික කාර්යභාරය පුළුල් වී ඇති අතර අධ්‍යාපන ක්‍රම නිසා රැකියාවන් සම්බන්ධව ඉහළ බලාපොරොත්තු ඇති වී තිබේ. එහෙත් පුරුෂයන් මෙන්ම කාන්තාවන් විසින් ද ගේ දොර කටයුතු මුළුමනින්ම කාන්තාව සතු යැයි කල්පනා කරනු ලැබේ. අධ්‍යයන වලින් හෙලි වී ඇති අයුරු කාන්තාවන් ස්වකීය ආර්ථික සමාජයම හා ගේ දොර කටයුතු සඳහා දිනකට පැය 14 ක් වැය කරන අතර පිරිමින් ඒ සඳහා වැය කරන්නේ පැය 9 කි. (ජයවීර,1995,පිː15)

ස්ත්‍රී පුරුෂ ශ්‍රම දායකත්වය පිළිබඳ කරුණු සොයා බැලීමේ දී ග්‍රාමීය ආර්ථිකයේ ශ්‍රම දායකත්වය සංඛ්‍යාත්මක ලෙස සටහන් වීමක් කොතැනකවත් දක්නට නොමැත. සංවර්ධනය ක්‍රියාවලියේ දී කාන්තා දායකත්වය විශාල ලෙස පෙන්නුම් කරන අතර ඉන් වැඩි කොටසක් ග්‍රාමීය කාන්තාවන්ගේ ශ්‍රමයයි. **(UNDP, 1980, p:6)**

සංවර්ධන කටයුතු සඳහා ග්‍රාමීය කාන්තාව ඇතුළත් කර ගැනීමට යොදවා ඇති උපාය මාර්ග දෙස බැලීමේ දී අපට පෙනී යන්නේ ඒවා ඉතා දුර්වල මට්ටමක පවතින බවයි. බොහෝ විට ග්‍රාමීය කාන්තාවගේ ආර්ථික කටයුතු පවතින සමාජ පසුබිම මත සකස් වී ඇත. ඒ නිසා ඔවුන් අඩු ආදායම් ලබන මාර්ග වල නිරතවීම බහුලව දක්නට ඇත. ඒ නිසා අඩු ආදායම් ලබන්නන් ලාභදායි නොවන කටයුතු වලත් වැඩි ආදායම් ලබන්නන් වැඩි ආදායම් මාර්ගවලත් නිරතවෙමින් තව තව වැඩියෙනුත් ලාභ ලබයි. මේ තත්ත්වය සංවර්ධන ක්‍රියාවලියේ ඉතා පැහැදිළි ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ගැටළුවකි.